01.2020.03.16 වන සදුදා දින මේ වන විට රජයේ හා බැංකු විශේෂ නිවාඩු දිනයක් බවට මේ වන විට ප්‍රකාශයට පත් කළා. දුරටත් අත්‍යවශ්‍ය වන්නේ නම් පමණක් මෙම නිවාඩුව දීර්ඝ කිරීමට කටයුතු කරනවා.

02. කොරෝනා වෛරසයෙන් ආරක්ෂා වීමට අවශ්‍ය උපදෙස් දක්වා විශේෂ චක්‍රලේඛයක් සියලුම ආයතන ප්‍රධානින් වෙත නිකුත් කිරිමට කටයුතු කරනවා.

03.විශේෂයෙන්ම මහජනතාවගෙන් ඉල්ලා සිටින්නේ තම අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා පමණක් රජයේ කාර්යාල වෙත පැමිනෙන ලෙසත් දුරකතන මගින් සාකච්ඡා කර අත්‍යවශ්‍ය නම් පමණක් කාර්යාල වෙත පැමිණෙන ලෙස දන්වනවා.

04.දුරකතන මගින් කරනු ලබන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය නිලධාරීන් කාර්යාලවල ස්ථාන ගතකර ඇත.

05. දැනට විශාල වශයෙන් ජනතාව රැස්කරන වැඩසටහන්, පුහුණු රැස්වීම් ආදිය තාවකාලිකව අත්හිටුවන ලෙස එම සංවිධායකයින්ගෙන් ඉල්ලා සිටිනවා.

06.රජයේ කාර්යලවල අත්‍යව්‍ය මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් අතවශ්‍ය නිලධාරීන් පමණක් කාර්යාල වෙත කැඳවීමටත් කටයුතු කරන බවත් කොරෝනා රෝග තත්ත්වය තවදුරටත් ව්‍යාප්ත වන්නේ නම් පමණක් රජයේ කාර්යාල තාවකාලිකව වසාතැබීමට කටයුතු කරන බවත් දන්වනවා.

07.සියලූම රාජ්‍ය නිලධාරීන් මෙම කොරෝනා රෝග තත්වයෙන් ආරක්ෂා කරගැනීමට අවශ්‍ය වෛද්‍ය කාර්ය මණ්ඩලවල සහය ලබාගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස සියලූම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් ප්‍රධාන ලේකම්වරු, දිසාපතිවරු,දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු සියලුම රාජ්‍ය නිලධාරීන් වෙත දැඩිව උපදෙස් දෙනවා.

08.රටේ සියලුම විහාරස්ථානවල මේ වනවිට තුන් සූත්‍රය දේශනා කිරීමට කටයුතු කරන බවත් අනෙකුත් ආගමික ආශීර්වාදයන්ද ලබාගැනීමට කටයුතු කරන ලෙසත් මෙම සියලුම කටයුතුවලදී ජනතා සහභාගීත්වය අවම වශයෙන් ලබාගැනීම සුදුසු බවත් උපදෙස් දෙනවා.

ජනක බණ්ඩාර තෙන්නකෝන්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය